## නාමෙල් වීරමුණි

*තිස්ස නාමෙල් ද සිල්වා වීරමුණි හෙවත් නාමෙල් වීරමුණි මෙළොව එළිය දුටුවේ 1934 වසරේ අගෝස්තු මස 31 දින අහුන්ගල්ලේදීය. ඒ, ප්‍රදේශයේ කුරුඳු ව්‍යාපාරිකයකු වූ ජෝන් ද සිල්වා සහ ඔහුගේ බිරිය ස්වෝන් වීරමුණි ගේ කැදැල්ලේ කුළුදුල් දරුවා ලෙසිනි. කුඩා අවදියේම මවත් පියාත් අකල් මරණයන්ට ගොදුරු වූයෙන් එතැන් සිට නාමෙල් සහ ඔහුගේ එකම නැගණිය කැරලයින් හැදී වැඩුණේ සිය සමීප ඥාතීන් සෙවනේය. ගල්වෙහෙර ප්‍රාථමික පාසලෙන් මූලික අධ්‍යාපනය ලද නාමෙල් පසුව පේරාදෙණිය මහ විද්‍යාලයටත් අනතුරුව රත්නපුර ශාන්ත ලූකස් විද්‍යාලයටත් අවසන කොළඹ නාලන්ද විද්‍යාලයටත් ඇතුළත්ව පාසල් අධ්‍යාපනය අවසන් කළේ එවක ලංකා විශ්ව විද්‍යාලයේ (දැන් පේරාදෙණිය) කලා අංශයට ඇතුළත්වීමට සුදුසුකම් ලබමිනි. 1957 වසරේ විශ්ව විද්‍යාලයට ඇතුළත්වූ හෙතෙම ඉන් පිටවූයේ සමාජ විද්‍යාව විෂයෙහි ගෞරව උපාධිධාරියකු ලෙසිනි. 1960 වසරේ රත්නපුර සිරිසුමණ විද්‍යාලයට ගුරුපත්වීමක් ලත් නාමෙල් පසුව තිස්ස මහා විද්‍යාලයේත් තෙවනුව කොළඹ ශ්‍රී ලංකා විද්‍යාලයේත් ගුරුවරයකු ලෙස වසර කීපයක් සේවය කළේය.*

*ගුරු වෘත්තියේ යෙදෙමින්ම 1964 වසරේ ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත්වූ නාමෙල් 1971 වසරේ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු බවට පත්විය. පසුව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරයෙකු ලෙස ද කලක් සේවය කළ නාමෙල් අනතුරුව එංගලන්තයට ගොස් එහි නීතිඥ සමාගමක් පිහිටුවාගෙන දශක තුනක පමණ කාලයක් එංගලන්ත ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතියකු ලෙස කටයුතු කළේය. නීති වෘත්තියෙන් සමුගෙන 1993 වසරේ ඇමරිකාවට ගිය හේ එහිදී රංග කලාව පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා යළි සිය රට පැමිනෙන්නේ 2002 වසරේදීය.*

*නාමෙල් වීරමුණිගේ කලා ජීවිතය ඇරඹෙන්නේ ඔහු සරසවි සිසුවෙකුව සිටියදී ය. ඒ එදිරිවීර සරත්චන්ද්‍රගේ 'රත්තරං' නාට්‍යයේ ප්‍රධාන චරිතය නිරූපනය කරමිනි. පසුව සුගතපාල ද සිල්වාගේ 'හරිම බඩු තුනක්', 'හෙලේ නගින් ඩෝං පුතා', 'හිත හොද අම්මණ්ඩි', සහ සුනන්ද මහේන්ද්‍රගේ 'ගැහැණියක්', යන නාට්‍ය ප්‍රමුඛව නාට්‍ය රැසක ප්‍රධාන නලුවා වූ නාමෙල් විසින් ලියා අධ්‍යක්ෂණය කළ ස්වතන්ත්‍ර නාට්‍ය මෙන්ම පරිවර්තනද කීපයකි.*

*වේදිකාවෙන් සිනමාවටද පිවිසි නාමෙල් වසන්ත ඔබේසේකරගේ 'වෙස්ගත්තෝ' (1969) 'වල්මත්වූවෝ' (1972) ටයිටස් තොටවත්තගේ 'හාර ලක්ෂය'(1970) සේන සමරසිංහගේ 'කස්තූරි සුවඳ'(1969) 'සඳහටම ඔබ මගේ'(1968) නිමල් ද සිල්වාගේ 'ලස්සන දවසක්' (1968) සෝමරත්න දිසානායකගේ 'පුංචි සුරංගනාවි'(2000) එච්.ඩී. ප්‍රේමරත්නගේ 'මන්දාකිනි' (1995) යන චිත්‍රපට ඇතුළුව චිත්‍රපට රාශියකට සිය රංගන දායකත්වය එක්කරනු ලැබුවේය. පසුව රූපවාහිනී නිර්මාණයන්ටද සම්බන්ධ වූ නාමෙල් රංගන දායකත්වය සැපයූ ටෙලි නාට්‍ය අතර විමල් අධිකාරිගේ 'ඉසිවර අසපුව'(1994) තිස්ස අබේසේකරගේ 'ධනසරණ'(1996) දයාරත්න රටගෙදරගේ 'දොළොස් මහේ අපි' මෙන්ම විකාශයට නියමිත ටෙලි නාට්‍ය කීපයක්ද තිබේ. බොරැල්ල කොටා පාරේ 'පුංචි තියටර්' ඔහු විසින් ශ්‍රී ලංකාවේ රංග කලාව වෙනුවෙන් නිර්මාණය කළ අපූර්ව නිර්මාණ යකි. වර්තමානයේ එහි කටයුතු කළමනාකරණය කරමින් ජීවිතයේ සැඳෑ සමය ගෙවමින් සිටින නාමෙල් වීරමුණි දරු තිදෙනෙකුගේ පියෙකි. ඔහුගේ ප්‍රිය බිරිය මාලිනී පද්මිණී ද සිල්වා එදිරිමුණි ද කලා ශිල්පිනියකි.*



# මම තමයි එකම එක නාමෙල්

**අපේ කතාබහ ඔබගේ නමෙන් පටන්ගන්න මම කැමතියි. ඔබගේ නම සඳහන් වෙන්නේ නාමෙල් වීරමුණි කියලා. නාමෙල්ද? නාමල්ද? කියන එක වගේම, තාත්තගේ පෙළපත් නම සිල්වා වෙනුවට අම්මගේ පෙළපත් නමේ වීරමුණි ඔබගේ නමට එකතුවුණොත් කොහොමද ?**

මගේ නම නාමෙල්. ලංකාවේ නාමල්ල නම් ඕනේ තරම් ඉන්නවා. නාමෙල් කෙනෙක් ඉන්නේ එක්කෙනයි. ඒ මම. මම ඉපදුන කාලේ ළමයෙකුට නමක් තියනවා කියන එක මහ බරපතල කාරණයක් විදිහට තමයි සමාජයේ සැළකිලා තියෙන්නේ. සුබ අකුරු හොයලා ඝණ පිහිටවලා නමක් දාන්න සෑහෙන මහන්සියක් ගන්නත් ඒ කාලේ සිද්ධ වෙලා තියනවා. ඉතිං මට නමක් දාන්නත් ඔය විදිහට අකුරු ගලප ගලප අම්මා මහන්සිවෙන වෙලාවේ තාත්තා කිව්වලු නාමල් නෙවෙයි නාමෙල් කියලා දාන්න කියලා. අම්මගේ පෙළපත් නම යොදාගත්තේ මම පස්සේ කාලෙක. මුලින් මම නාමෙල් සිල්වා කියලා පාවිච්චි කළේ. විශ්ව විද්‍යාලයේ ඉන්න කාලේ සරච්චන්ද්‍ර මගෙන් ඇහුවා මොකක්ද මේ සිංහල නමක් දාගන්නේ නැතුව සිල්වා කෑල්ලක් එල්ලගෙන ඉන්නේ කියලා. මමත් ඒ ගැන හිතුවා. පස්සේ මම තාත්තගේ නමේ සිල්වා කෑල්ල වෙනුවට අම්මගේ නමේ වීරමුණි කෑල්ල අගට යොදාගන්න තීරණය කළා. ඔය විදිහට තමයි මගේ නම නාමෙල් වීරමුණි වුණේ.

**දීර්ඝ කාලයක් පිට රටක ගෞරවනීය පුරවැසියෙකු විදිහට ජීවත්වුණ ඔබ ඇයි ජීවිතේ සැන්දෑ සමය තමන්ගේ දරුවන්ගෙනුත් වෙන්වෙලා මේ විදිහට ලංකාවේ හුදකලාව ගෙවන්නට කැමති වුණේ?**

මොන රටේ කොයි විදිහට ජීවත්වුණත් අපේ මුල් තියෙන්නේ මේ රටේනේ. මම මේ රටේ නිදහස් අධ්‍යාපනය ලබල ඉහළට ගිය කෙනෙක්. ඒ නිසා මම හිතුවා ආපහු මගේ රටට ගිහින් මට පුළුවන් විදහට යම් සේවයකුත් කරගෙන ජීවිතේ අවසාන කාලේ ගෙවන්න ඕනේ කියලා. අනික ඒ රටෙන් මට ගන්න තිබුණ හුගාක් දේවල් මම මේ වෙනකොට අරගෙන ඉවරයි. මගේ දරුවෝ තුන්දෙනාටම හොඳට උගන්නලා වෘත්තීයවේදින් කරන්න මට එහෙදි පුළුවන් වුණා. ඒ අය දැන් එහෙ හොඳින් ජීවත්වෙනවා. මමත් අවුරුද්දකට සැරයක් දෙකක් ගිහින් බලලා එනවා.

**ඔබ ඔය විදිහට රට ගැන ලොකු හැඟීමකින් කතා කළත් මේ රටේදි ඔබට මුහුණ දෙන්න සිදුවුණ අප්‍රසන්න අත්දැකීම්වල ප්‍රතිපළයක් විදිහට නේද ඔබට පිටරටක පදිංචි වෙන්න සිද්ධවෙන්නේ?**

ඔව් ඒක ඇත්ත. මම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරයෙක් විදිහට වැඩකරන කාලේ තමයි ඒ සිදුවීම වුණේ. මට මාස තුනක ශිෂ්‍යත්වයක් ලැබුණා කැනඩාවට ගිහින් රතු ඉන්දියානුවන් ගැන අධ්‍යනයක් කරන්න. මම මාස තුනකට නිවාඩු අනුමත කරවගෙන කැනඩා ගියා. මාස තුන ඉවරවෙලා ආපහු එන ගමනේදි මගේ යාලුවෙක් (ජයන්ත ධනපාල) මුණගැහෙන්න වොෂින්ටන්වලට ගියා. එහෙදි ඔහු මට සෙනෙට් එකේ නිරීක්ෂකයෙකු විදිහට මාස තුනක් වැඩකරන්න අවස්ථාවක් අරගෙන දුන්නා. ඒකත් කරගෙන එන්න කියලා තීරණය කරලා තවත් මාස තුනකට මගේ නිවාඩුව දීර්ඝ කරගන්න මම අධිකරණ අමාත්‍යාංශයට ඉල්ලීමක් එව්වා. මෙහෙන් මට කියලා එව්වා ඇමැතිතුමා කියනවා වහාම ආපහු එන්න කියලා කියලා. ඉතිං රස්සාව රැකගන්න ඕනේ නිසා මම ආපහු එන්න ප්ලේන් එකක් ගන්න එංගලන්තයට ආවා. දැන් කාලේ වගේ නෙවෙයි ඒ කාලේ සතියකට ගමන්වාර එකක් දෙකක් තමයි ලංකාවට ගුවන් ගමන් තිබුණේ. ඒ නිසා සතියක් විතර එංගලන්තෙත් නැවතිලා ඉන්න මට සිද්ධවුණා. ප්ලේන් එකක් හම්බවුණ ගමන් මම මාලිනීට කතා කරලා කිව්වා මම හෙට ලංකාවට එනවා කියලා. එතකොට එයා කිව්වා අපි සන්තෝසෙන් බලං ඉන්නවා ඔයාව දකින්න. අද

> *ඕක දන්න අය මට කිව්වේ ත්‍රයිලෝනා කියලා. මොකද මම ගේ හදන්න ණය තුනක් ගත්තා.*

අමාත්‍යාංශයෙන් ලිවුමක් එවලා තියනවා ඔයාව රස්සාවෙන් අයින් කළා කියලා කියලා. ඒ වෙනකොට මගේ අනුමත මාස තුනේ නිවාඩුව ඉවරවෙලා තවත් සති දෙකකටත් වැඩිය ගිහිල්ලා. මට දෙවියන් බුදුන් සිහිවුණා. මොකද ඒ වෙනකොට මම බැංකු ණය ගණනාවක් අරගෙන ගෙයක් හදලයි තිබුණේ. දැන් ඉතිං ගෙදරත් බැංකුවට සින්නවෙලා අපිට පාරට බහින්න තමයි වෙන්නේ කියලා මට හිතුණා. ඒ විපතෙන් ගැලවෙන්න තියන එකම ක්‍රමය විදිහට එංගලන්තෙම නැවතිලා සල්ලි ටිකක් හොයාගෙනම ලංකාවට එන්න මම ඒ වෙලාවේ තීරණය කළා.

**ඔබ ණය ගන්න දක්ෂ නිසාම ඒ කාලේ යාලුවෝ නමකුත් පටබැදලා තිබ්බලු නේද ?**

ඕක දන්න අය මට කිව්වේ ත්‍රයිලෝනා කියලා. මොකද මම ගේ හදන්න ණය තුනක් ගත්තා. නිවාස ණයයි. වාහන ණයයි. වාහන අලුත්වැඩියාවට දෙන ණයයි. ඒ ඔක්කොම දාල තමයි ගේ හැදුවේ. ණය තුනක් නිසා ත්‍රයිලෝනා කියලා නම දාලා තිබුණා. අද වගේම තමයි. ඒ කාලෙත් ගෙයක් හදනවා කියන එක හරි අමාරු දෙයක්.

**ඒ විදිහට අසරණයෙක් විදිහට එංගලන්තේ අතරමංවුණ ඔබ කොහොමද ජීවිතේ ආයෙත් පටන්ගත්තේ?**

එහෙදි මට මුණගැහුණා රඹුක්පිටිය කියලා යාලුවෙක්. එයා තමයි මුල අල්ලගන්න සෑහෙන්න උදව් කළේ. එයා හිටපු තැන නැවතිලා ඉඳගෙන මම පොඩි පොඩි ජොබ් කීපයක්ම කළා. හෝටලේක වැඩකළා. සාප්පුවක වැඩකළා. පැට්ට්‍රල් ෂෙඩ් එකක වැඩකළා. ඒවයින් යම් මුදලක් හොයාගත්තා. එහෙම ඉන්න අතරේ මම හොයලා බැලුවා මගේ වෘත්තීය සුදුසුකම්වලට ජොබ් එකකට යන්න පුළුවන්ද කියලා. ඒ වෙනකොට මට සමාජ විද්‍යා උපාධියත් තිබුණා. නීතීඥයකු විදිහට ලංකාවේදි ලබපු වෘත්තීය සුදුසුකමත් තිබුණා. හොයලා බලන කොට දැනගන්න ලැබුණා එහෙ අවුරුදු තුනක් නීතීඥ සමාගමක වැඩ පුහුණු වුණොත් මගේ නමිනුත් සමාගමක් පටන්ගන්න ඒක සුදුසුකමක් වෙනවා කියලා. ඒ වෙනකොට මම වැඩ කළේ පැට්ට්‍රල් ෂෙඩ් එකේ. එතන හිටිය මැනේජර් ඉන්දියන්කාරයෙක්. හොඳ මිනිහා. මම එයාට මේ ගැන කියලා උදේ හතේ ඉඳලා නවය වෙනකම් ෂෙඩ් එකේ වැඩකරන්නත් ආපහු හවස හතරහමාරේ ඉඳලා රෑ එකොළහ වෙනකම් ෂෙඩ් එකේ වැඩකරන්නත් හදාගත්තා. දවල්ට නීතීඥ සමාගමක පුහුණුවට ගියා. ඒ විදිහට අවුරුදු තුනක් ගියාට පස්සේ මමත් බොහොම පුංචියට මගේ නමින් නීතීඥ සමාගමක් පටන්ගත්තා. එතනින් පස්සේ තමයි ජීවිතේ අලුතෙන් ගොඩනැගෙන්න පටන්ගත්තේ. ඒ වෙනකම් බොහොම අමාරුවෙන් තමයි ජීවත්වුණේ.

**අවසානයේ මේ සමාගම විශාල එකක් බවට පත්වෙනවා. ඔබගේ ජීවිතය ස්ථාවර වෙනවා. ඒක එහෙම නොවුණ නම් ආපහු ලංකාවට ආවට පස්සේ ඔබට මොනවගේ තත්තවයකටද මුහුණ පාන්න වෙන්නෙ?**

මගේ නීතිඥ සමාගම ඉක්මනටම දියුණු වුණා. නීතිඥයන් එක්ක සේවකයෝ 41 දෙනෙක් මගේ යටතේ එහෙ වැඩකළා. ඒ වැඩ කරගෙන අවුරුදු 29ක් මම එංගලන්තේ ජීවත්වුණා. දරු පවුලත් එහාට ගෙන්න ගත්තා. ඒ හැම දෙයක්ම එහෙදි සිද්ධ වුණත් මම හිතන්නේ අපිට වාසනාව තියනවා නම් ඒක කොයි රටේ හිටියත් යම්වෙලාවකදි මතුවෙනවා. ඒ නිසා මම එදා ආපහු ලංකාවට ඇවිල්ලා තිබුණත් ඒ දේවල් ඒ විදිහටම වෙයි කියලා මම විශ්වාස කරනවා.

**ඒ කියන්නේ ඔබ ජොතිෂ්‍ය වගේ දේවල් විශ්වාස කරනවා ?**

ඔව්. හැබැයි සමාජ විද්‍යාඥයෙක් විදිහට මම ඒවාට වහල්වෙලා වැඩකරන්නේ නෑ. නමුත් ජෝතිෂ්‍ය, ආගම් වගේ දේවල්වල සත්‍යයක් තියනවා කියලා මම විශ්වාස කරනවා.

**ඔබ මව් රටේ ප්‍රසිද්ධ නීතිඥයෙකු විදිහට නෙවෙයි. කලා ශිල්පියෙක් විදිහටයි. වෘත්තීය නීතිඥයෙක් විදිහට කොහොමද කලා ක්ෂේත්‍රයට පිවිසුණේ ?**

විශ්ව විද්‍යාලේ ඉගෙන ගන්න කාලෙමයි කලාවට යොමුවුණේ. පනස්හතේ මම ලංකා විශ්ව විද්‍යාලයේ කලා අංශයට ඇතුල් වුණා. අවුරුදු තුනක් විශ්ව විද්‍යාලේ ගත කළ කාලයේ නාට්‍යවලට සම්බන්ධ වුණා. හැටදෙකේ සරත්චන්ද්‍රගේ 'රත්තරං' නාට්‍යයේ ප්‍රධාන චරිතයෙන් ප්‍රසිද්ධ වේදිකාවට ආවා. පස්සේ

ශ්‍රීලාල් සෙනෙවිරත්න

චිත්‍රපටිවලටත් සම්බන්ධ වුණා. එංගලන්තේ ඉන්න කාලේ වැඩිපුර කලා කටයුතුවලට සම්බන්ධ වෙන්න ඉඩක් තිබුණේ නෑ. නමුත් පරිවර්ථන නාට්‍ය වගේ දේවල් කළා. ටික කාලයක් බීබීසියේ වැඩසටහනක් කළා. එහෙ නීතිඥ සමාගම වහලා අනූතුනේ මම ඇමරිකාවට ගියා. ඇමරිකාවේ අවුරුදු පහක් හිටියා. ඒ ඉන්න කාලේ රංග කලා පීඑච්ඩී එකක් කළා.

**ඔබගේම වෙහෙස මහන්සියෙන් බොරැල්ලේ හදලා තියන 'නාමෙල්-මාලිනි පුංචි තියටර්' එක අපිට දකින්න තියන අනෙක් හැම තියටර් එකකටම වඩා වෙනස් ආකෘතියක එකක්. මේ වෙනස නිසා සමහරු මේකට කියන්නේ තුඹස කියලා. කොහොමද මේ වගේ අදහසක් ක්‍රියාවට නැගුණේ?**

මේක 1962 මගේ හිතට ආව අදහසක්. ක්‍රියාවට නැගෙන්න කාලයක් ගතවුණා. විශ්ව විද්‍යාලෙන් පිටවෙලා කොළඹ ඇවිල්ලා ඒ කාලේ නාට්‍ය කරනකොට අපිට පුහුණු වෙන්නවත් තැනක් තිබුණේ නෑ. රෝයල් කොලේජ් එකේ ප්‍රාථමික අංශයේ ගස් යට තමයි අපි පුහුණුවීම් කළේ. ඒ කාලේ මට අදහසක් ආවා මේ වගේ තියටර් එකක් තිබුණානම් කියලා. ඒ ගැන එකට වැඩකරන අයත් එක්ක කතා කරලා